සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 9 - ශ්‍රේණිය

## නර්තනය

**නම/විභාග අංකය :- ............................................................** **කාලය: පැය 02යි.**

**I කොටස**

- අංක 01 සිට 20 තෙක් සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) ශෝකය නැමැති ස්ථායි භාවයෙන්......................... රසය උපදී

(1) කරුණා (2) භයානක
(3) අද්භූත (4) ශාන්ත

(02) ගොයම් කැපීමේ නැටුමේදී ............................අතැතිව නර්තනයේ යෙදීම චමත්කාර ජනක වේ.

(1) උදැල්ල (2) දෑකැත්ත
(3) විසිකැත්ත (4) කුල්ල

(03) ශිල්පියකුගේ මූලික හැඩතල සකස්කරගැනීම සඳහා උඩරට සම්ප්‍රදායේදී ගොඩ සරඹද, පහතරට දී ඉලංගම් සරඹද සබරගමු................................................. නර්තනය කරයි.

(1) මණ්ඩි පද (2) අලංකාර පද
(3) දොඹින පද (4) මාත්‍රා පද

(04) සාම්ප්‍රදායික මිනුම් ක්‍රමය අනුව ගැටබෙරයේ දිග........................කි.

(1) තුන්වියත් පස්ගුලයි (2) දෙවියත් තුන්ඟුලයි.
(3) එක්වියත් තුනඟුලයි (4) තුනවියත් තුනඟුලයි

(05) පංචතූර්ය භාණ්ඩ වාදනය කරන ආගමික උත්සව අවස්ථාවක් ...................................... හැඳින්විය හැක.

(1) ශාන්තිකර්ම (2) ජාතික උත්සව
(3) මංගල උත්සව (4) පිරිත් පිංකම්

(06) ''සිහින් සිනිඳු සළුව පැලඳ විත් උන් මරගන''......................... කවියකි.

(1) මල් යහන් (2) ග්‍රහපන්ති
(3) කඩතුරා (4) සොකරි

(07) ''නටන ගහපතියාගේ දුව විසින් පවරාදෙන ලදී'' යනුවෙන් සඳහන් වන්නේ,

(1) සැස්සේරුව සෙල්ලිපියේ ය (2) කොරවක්ගල ලෙන් ලිපියේ ය
(3) පාලමොට්ටායි සෙල්ලිපියේ ය (4) කාලිංග වනෝද්‍යානයේ ගල් ආසන ලිපියේ ය

(08) උඩරට, පහතරට, සබරගමු සම්ප්‍රදායන් ත්‍රිත්වයට අයත් ප්‍රධාන ශාන්ති කර්ම වනුයේ,

(1) කොහොඹාකංකාරිය, දෙවොල්මඩුව, පහන් මඩුව

(2) කොහොඹාකංකාරිය, දෙවොල්මඩුව, රටයකුම

(3) කොහොඹාකංකාරිය, පහන් මඩුව, ගම්මඩුව

(4) කොහොඹාකංකාරිය, පහන් මඩුව, රටයකුම

(09) වාචික අභිනයෙන් තොරව චලන මාධ්‍ය කොටගෙන මුද්‍රා මඟින් අදහස් ප්‍රකාශ කරන නාට්‍ය වන්නේ,

(1) ගීත නාට්‍යයි
(2) මුද්‍රා නාට්‍යයි
(3) ශෛලීගත නාට්‍යයි
(4) තාත්වික නාට්‍යයි

(10) ''රන්වන් දුන් කරලින් පැසිලා......................'' ගීතය අඩංගු චිත්‍රපටිය වන්නේ,

(1) අලිබබා සහ හොරු හතලිහ
(2) සත් සමුදුර
(3) මාතලන්
(4) රන්මුතුදූව

(11) රාජ්පූර් වංශවතුන්ගේ ඇඳුමට සමාන වූ රංග වස්ත්‍රාභරණ භාවිතයට ගනු ලබන්නේ,

(1) භරත නර්තනය සඳහා ය
(2) කෝලාට්ටම් නර්තනය සඳහා ය
(3) කරගම් සඳහා ය
(4) කථක් නර්තනය සඳහා ය

(12) අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා වඩාත් දක්ෂතාවයක් දැක්වූයේ

(1) උඩරට නර්තන කලාවට ය .
(2) පහතරට නර්තන කලාවට ය
(3) සබරගමු නර්තන කලාවට ය
(4) භාරතීය නර්තන කලාවට ය

(13) පහතරට දොවොල්මඩු ශාන්ති කර්මය අතීතයේ පැවැත්වීමට හේතු වූයේ

(1) මලය රජුට ඇති වූ දිවිදොස සුව කිරීම සඳහා ය

(2) පඩුවස් දෙව් රජුට වැලඳුන දිවිදොස සුව කිරීම සඳහා ය

(3) සේරමන් රජුට ඇති වූ හිසරදය සුව කිරීම සඳහා ය

(4) විජය රජුට ඇති වූ හිසරදය සුව කිරීම සඳහා ය

(14) සොකරි නාටකයේ කවි ගායනය සඳහා වාදනය කරනු ලබන බෙර පදය වන්නේ

(1) දොං ජිංත ගත දොංත
(2) දොංජිජිගත
(3) දොදොංත තකුදොං
(4) ජිංගත ගොගො

(15) ''ලෙලදුන් නව තඹ පලුවන් පාදේ''.............. යන කවි පදය අයත් සංදේශ කාව්‍ය වන්නේ,

(1) පරෙවි සංදේශයයි
(2) සැලලිහිණි සංදේශයයි
(3) තිසර සංදේශයයි
(4) කොවුල් සංදේශයයි

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.**

(16) විතතාතත යනු අනිත් සහ කඩිප්පුවෙන් වාදනය කරන වාද්‍ය භාණ්ඩ වේ. (   )

(17) ශෝකය නැමැති ස්ථායි භාවය උපදින විට ඇස් අඩවන් වීම සිදු වේ. (   )

(18) කයිපුඩි වලල්ල දක්නට ලැබෙන්නේ පහතරට බෙරයේ ය (   )

(19) ''රුකම්'' නර්තන කලාවේ ඓතිහාසික පසුබිම සොයාගත හැකි මූලාශ්‍රයකි. (   )

(20) ''පත්තිනි' දේවතාවිය කොහොඹාකංකාරියේ දී පුද ලබන දේව කොට්ඨාශයට අයත් ය. (   )

## <u>II කොටස</u>

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (1) පහතරට ශාන්තිකර්මවල එන .......................උපත කියවෙන කවි පන් නැටුම සඳහා යොදා ගනී.

(2) ගැටබෙරයෙන් වාදනය වන බීජාක්ෂර ගණන .................................................ක්ය.

(3) කඩතුරා කවි ගායනයේදී භාවිතා කරන රංග සැරසිල්ල .................................. ලෙස හැඳින්වේ.

(4) අම්මාවරුන්ගේ ලෙඩ ලෙස හඳුන්වන රෝගවලින් අත්මිදීමට ...................................... ශාන්ති කර්මය පවත්වනු ලබයි.

(5) කථක් නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය .............................. වේ.

(6) නල දමයන්ති මුද්‍රා නාට්‍ය ..................................... මහතා විසින් නිෂ්පාදනය කරන ලදී.

(7) වැස්ස වැහැගෙන එන මොහොත තේමා කරගත් ''අක්කේ අක්කේ අර බලන්නකෝ'' ගීතයේ පද රචනය .......................................... මහතාගේ ය.

(8) පා සරඹ අභ්‍යාස කිරීමේදී .......................................... වාදනය කරනු ලබයි.

(9) ''ස්වස්තථාව'' කෙරෙහි බලපාන ප්‍රධාන සාධක දෙක නම් කරන්න.

(1) ......................................................  (2) ....................................................

(10) නාට්‍යක් ඉදිරිපත් කරන ආකාරය අනුව ශෛලීන් දෙකයි.

(1) ....................................................  (2) .....................................................

(02) (i) මාත්‍රා 2 + 3 ට අයත් බෙර පදයක් ප්‍රස්ථාර කරන්න.

(ii) ''රන් දැකැති ගෙන නිති සැරසෙනවා"

" රත්රං පටි ඉන වට දිලිසෙනවා" යන කවි පද දෙක මාත්‍රා 4 / 4 තනි තිතට ප්‍රස්තාර කරන්න.

(iii) මාත්‍රා 3 + 3 තාලරූපයට අයත් වන්නමක අඩව්වක් / ඉරට්ටියක් ප්‍රස්ථාර කරන්න.

(3) (1) කථක් නර්තනය ප්‍රචලිත ප්‍රදේශ 02 ක් ලියන්න.

(2) කථක් නර්තනයේ සරානා 4 නම් කරන්න.

(3) කථක් නර්තනයේ නර්තන අංග 5ක් ලියන්න.

(04) (1) ගැටබෙරය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

(2) ගැටබෙරය සාදා ගැනීම සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය පිළිබඳව කෙටියෙන් ලියන්න.

(3) ගැටබෙරයේ රූප සටහනක් ඇඳ කොටස් 05 ක් නම් කරන්න.

(05) (1) නර්තන කලාවේ ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු සඳහන් මූලාශ්‍ර 2ක් නම් කරන්න.

(2) නර්තන කලාව පැවැති බවට තොරතුරු දක්වෙන සංදේශ කාව්‍යයක කවියක් ලියන්න.

(3) පාලමොට්ටායි සෙල්ලිපිය ඇසුරින් නර්තන කලාව පැවැති ආකාරය විස්තර කරන්න.

(06) මාතෘකා 03ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(1) භාව ප්‍රකාශන

(2) ගැමි නැටුම්

(3) අර්නෝලිස් ඉඹුල්ගොඩ ගුරුතුමා

(4) දේශීය නාට්‍ය වර්ග

(5) සරල රංග උපකරණ නිර්මාණය

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 9 - ශ්‍රේණිය

## නර්තනය (ප්‍රායෝගික පරීක්ෂණය)

**නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 02යි.**

(01) (1) කැමති ගායනයක්

(2) නම්කරන ලද ගායනයක් (කඩතුරා, ගොයම්, පන්, සොකරි)

(3) කැමති බෙර සරඹයක් මධ්‍ය ලයට වාදනය

(4) නම් කරන ලද ගොඩ සරඹයක් කස්තිරම සමඟ මධ්‍ය ලයට (5, 6, 7)

(ලකුණු 5 × 4 = 20)

(02) (1) සිංහරාජ වන්නම කස්තිරම සමඟ හෝ

අනුරාග දණ්ඩ තාලය ඉරට්ටිය සමඟ හෝ

විරාඩි වන්නම කලාසම සමඟ නැටීම

(ලකුණු 20)

(03) පන් හෝ ගොයම් නැටුමට අදාළ කවි දෙකකට නර්තනය කිරීම (ලකුණු 20)

(04) රන්වන් දුන් කරලින් පැසිලා හෝ අක්කේ අක්කේ අර බලන්නකෝ ගීතයට අනුව නර්තනයක් ඉදිරිපත් කිරීමට (ලකුණු 20)

(05) කැමති චරිතයක් තෝරාගෙන නර්තන මාධ්‍යයෙන් ඉදිරිපත් කරන්න.

(1) ධීවරයා

(2) කුඹල්කරු

(3) ගොවියා

(4) තේ දළු නෙලන්නිය (ලකුණු 20)

(මුළු ලකුණු 100)